678.4 (548.7)(091)

# වසර සියයක් ගෙවුනු රබර් කර්මාන්තය

ඔස්වින් ද අල්විස් විසිනි
(කර්මාන්ත ශාලා නිලධාරී, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය)

## ඈත අතීතය

මිනිස් ඉතිහාසය පිළිබඳ කථාන්තරයේ සියක් වසරක් යනු ඉතා දිගු කලක් සේ නොසැලකෙයි. එතෙකුදු වුව, 1876–1976 වර්ෂාන්තරයෙහි මිනිස් විස්කම් මහිමයට හසුවූ එක් ස්වාභාවික ද්‍රව්‍යයක් නිසා මුළු මහත් පෙර අපර දෙදිගම ලද කාර්මික, විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රගතිය මේ යයි කියා නිමකළ නොහැක.

‘රබර්’ පිළිබඳ කථාන්තරයේ ආරම්භය වර්ෂ 1735 තරම් ඈත කාලයට දිවයයි. ඒ ප්‍රංශයේ පැරිස් ඇකඩමි නම් විද්‍යායතනය මගින් ‘මරී ද ලා කොන්දමීන්’ නම් විද්‍යාඥයා භූ විද්‍යා සමීක්ෂණ කටයුතු සඳහා දකුණු අමෙරිකාවට යැවූ සමයයි. එම පෙදෙස්වල වැසියන් එක්තරා ‘වල් ගස්’ විශේෂයකින් ලබාගන්නා යුෂ පාවිච්චි කොට පසුම්බි, බෝතල් වැනි උපකරණ සාදාගන්නා සැටිත්, එම ද්‍රව්‍යයවූ ‘කවුචුවු’ සාම්පල සමග සවිස්තර වාර්තාවක් පැරිස් ඇකඩමියට යැවූ ඔහු ලෝකයේ ප්‍රථමයෙන්ම රබර් පිළිබඳ විදු ඇස යොමු කරවීමට සමත් විය. ඇමෙසන් පෙදෙස්වල වැසියන් මෙය කවුචුවූ නමින් හැඳින්වූවද ක්විටෝ හා එස්මෙරෙල්ඩා පෙදෙස් වල වැසියන් හෙවෙ නමින් එය හැඳින් විය. මෙකී අන්වේශනය නිසාම කොන්දමීන් ‘රබර් කර්මාන්තයේ පියා’ යනුවෙන් ඉතිහාසකාරයෝ හඳුන්වති.

‘රබර් ’ නමැති මේ උද්භිද ද්‍රව්‍යයේ පුරාණය ‘මායා’ ශිෂ්ඨාචාරය තෙක් පැරණි බව සනාථ කරන මතයක් එම ශිෂ්ඨාචාරය පිළිබඳ බ්‍රිතාන්‍ය හොන්දුරා ප්‍රදේශයේ පුරා විද්‍යාත්මක ගවේෂණ යක යෙදුනු ආචාර්ය ගන් ඉදිරිපත් කරයි. එම වැසියන් එක්තරා පන්දු ක්‍රීඩාවකදී රබර් වලින් සාදන ලදැයි සිතිය හැකි පන්දු විශේෂයක් භාවිත කරන්නට ඇතැයි කැනීම් වලින් ලත් සාක්ෂි අනුව නිගමනය කර ඇත.

ඈත අතීතයේ දියුණු ශිෂ්ඨාචාරයක්ව පැවති මායා වරුන්ගේ ක්‍රීඩා භාණ්ඩයක් බවට පත්ව තිබූ ‘රබර් බෝලය’ කාර්මිකව අතිශය දියුණුවක් ලබා ඇති මෙම විසිවන සියවසෙහිද, තම පරපුර පවත්වාගෙන යයි. ඇමෙසන් පෙදෙසේ විසූ අඩ වනචාරී ස්වදේශිකයින් මැටි අච්චු තනා ඒ තුල රබර් කිරි බහා පාවහන්, බෝතල් ආදී භාණ්ඩද, රෙදි රබර් කිරෙහි ඔබා ‘ වැහි කබා’ ද නිපදවාගත් බව ඉතිහාසය පෙන්වා දෙන්නේ රබර් පිළිබඳ කථාන්තරය අවුරුදු 800ක් තරම් ඉපැරැණි බව සිහියට නංවමිනි.

## ස්වභාවික රබර් වල ව්‍යාප්තිය

හරියටම අදට වසර සියයකට පෙර, 1876 දී ලංකාවට හඳුන්වා දුන් රබර් පැලය මගින් මුළු මහත් අග්නිදිග ආසියාවේම රබර් කර්මාන්තයේ සමාරම්භය විනැයි සැලකීම නිවැරදිය. අද අක්කර කෝටි ගණනක් පුරා විහිද ඇති අග්නිදිග ආසියාවේ ‘රබර් කලාපය’ ව්‍යාප්තියට මුල්දුන් තෝතැන්න ශ්‍රී ලංකාව වීම අපට මහත් ආඩම්බරයකි.

රබර් පිළිබඳ දැනුම සියවස් කිහිපයක් පැවතුනද එය මහා පරිමාණ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වන්නට මුල පිරිම ප්‍රථම ලෝක සංග්‍රාමයෙන් ( 1914–1918 ) අනතුරුව විනැයි සිතීම සාධාරනය. 1910 දී ලෝකයේ රබර් සැපයුම ටොන් 100,000 කට සීමිත වුවද, 1920 වන විට එමෙන් තුන් ගුණයක රබර් කාර්මික භාණ්ඩ නිෂ්පාදනය සඳහා යෙදවින. ‘වල් රබර්,’ වලින් සැපයුනු ප්‍රමාණය අතිශයින් අභිභවා ‘වතු රබර්’ වෙළඳ පොලට ඒම පෙරදිග ලෝකයේ ‘රබර් ගබඩාව’ බවට අග්නිදිග ආසියාව පරිවර්තනය කරන්නට සමත් විය.

## රබර් කිරි

රබර් කර්මාන්තයේ සංවර්ධනය ගැන කථාකරන විට රබර් කිරි ගැනද යම් සඳහනක් කිරීම කාලෝචිතය. රබර් කිරි රබර් අංශු සමග රබර් නොවන අංශුද විසිරී පවතින "හයිඩ්‍රොසොලයක්" නමින් හඳුන්වන කලිලයකි. එහි ප්‍රෝටීන, සීනි, මේද අම්ල සහ අනෙකුත් සංකීර්ණ කාබනික

ද්‍රව්‍යද ඇත. පොලිඅයිසොප්‍රීනය නමින් හැඳින්වෙන රබර් හයිඩ්‍රොකාබනය, අංගාර හා ජලකර පරමාණු සංයෝගවීමෙන් සැදුන අණුවකි. තවද රබර් කිරෙහි 70% පමණ ඇත්තේ ජලයයි. ඝනද්‍රව්‍ය ඉතිරි 30%යි. ගසින් බැහැරට ගත් විගස රබර් කිරෙහි සංයුතිය මෙසේය.

| | | |
|---|---|---|
| රබර් | — | 41.0% |
| ජලය | — | 60.0% |
| ප්‍රෝටීන | — | 2.7% |
| රෙසිනමය ද්‍රව්‍ය | — | 3.4% |
| ක්ෂාරීය ද්‍රව්‍ය | — | 0.7% |
| සීනි | — | 4.2% |

සාමාන්‍ය රබර් කිරිගත් කල මිලි ලීටරයක රබර් අංශු 20,11,50,000 ඇතැයි ගණන් බලා ඇත. මෙම රබර් අංශු එය අඩංගුවන ද්‍රවයෙහි එහා මෙහා වේගයෙන් චලනය වෙයි. එය 'බ්‍රවුනීය චලනය' නමින් හැඳින් වේ. එක් එක් රබර් අංශුවක් වටා ඇති ප්‍රෝටීන කවරය ඍණ විදුලියෙන් ආරෝපනය වී ඇති බැවින් එක් එක් අංශුවක් එකිනෙක නොඇලී වෙන් වෙන්ව පවතී. අප එහි අම්ලගතිය (PH අගය ) 4.8 දක්වා අඩුකළ හොත් ඒවා කැටි ගැසීමට පටන් ගනී. අම්ල එකතු කළවිට සිදුවන්නේ රබර් අංශු වල ඇති ඍණ ආරෝපණ උදාසීන වී එකිනෙක වේගයෙන් ඇලීමයි.

## රබර් සැකසුම

මෙම රබර් කිරි කාර්මික අමු ද්‍රව්‍යයක් ලෙස පිළියෙල කිරීමේ මුල්ම ක්‍රමය වූයේ ඇමෙසන් ස්වදේශිකයින් භාවිත කළ ආකාරයයි. එනම් දුම් ගස්වා වේලීමයි. වසර සියයකට පසු අදද ඒ ක්‍රමය මදක් දියුණුකොට අපි භාවිතා කරමු. මුල් වකවානුවේදී දළ රබර් පිළියෙල වූයේ:

1) රබර් කිරි රවුම තැටිවල මුදවා පාන්පිටියෙන් සාදන රොටි මෙන් පැතැලි කොට වියලා ගැනීම හෝ
2) මිදවූ කිරි සිහින් තීරුවලට කපා වියළාගත් 'රබර් පණුවන්' නිමවීම හෝ

3) මිදවූ කිරි එතරම කාර්යක්ෂම නොවූ යන්ත්‍රානුසාරයෙන් දූල්මෙන් පිළියෙල කොට වියළා-ගැනීම ආදී ක්‍රම වලිනි.

## දුම් ගැසූ රබර්

අප කවුරුත් දන්නා දුම්ගැසූ මීට මෙන් සැකැසීම අමුද්‍රව්‍ය සැකසීම දියුණුවීමේ සන්ධිස්ථානයක් මෙන් විය. පෙර රබර් සකස් කිරීමේ මලේච්ඡ රූපාකාර නැති කිරීමේ කාර්යය පමණක් නොව රබර් රොටිය යහපත් ගණකමකින් හා ප්‍රමාණවත් දුම ගැස්වීම හේතුකොට ඇසට ප්‍රිය වර්ණයකින් හා කැඩීම, බිඳීම, බුබුළු ගැනීම ආදී දෝෂයන්ගෙන් ද විනිර්මුක්ත වීම නිසා එකල මෙය උසස් රබර් වර්ගයක් මෙන් පිළිගැනිණ. මිදවූ රබර් කිරේ තිබෙන අප ද්‍රව්‍ය, විශේෂයෙන් ප්‍රෝටීන් පදර්ථ ප්‍රති තත්ත්වයට පැමිණීමෙන් නිපැයෙන ද්‍රව්‍ය, රබර් ඇඹරීමේදී ජලයෙන් බොහෝසේ ඉවත් වුවද, ඇතුලත තෙතමනය සමග පිටවීමේදී රබර් පාට නරක් වීම හා එයින් බෝවන දිලීර වැනසීම පිණිස දුම්ගැස්වීම අවශ්‍ය විය. ඌෂ්ණය හා දුම විසින් තෙතමනය වියලන අතර දූව දැවීමෙන් දුමේ ජනිතවන 'ක්‍රියසෝට්' නම් ඖෂධය ප්‍රතිනාශකයක් විය.

## ක්‍රෙප් රබර්

දල රබර් නිෂ්පාදනයෙහි උපරිම අවස්ථාව වශයෙන් සැළකිය හැක්කේ ක්‍රෙප් රබර් සකස් කිරීම ආරම්භ වීමයි. වර්ෂ 1906 දී පමණ මෙය ප්‍රැන්සිස් හොලොවේ නම් ඉංග්‍රීසි ජාතික වැවිලි කරුවකු විසින් මාතලේ රබර් වත්තක කර්මාන්තශාලාවෙහි නිප්පාදනය කළ බැව් වාර්තාවේ. එහෙත් තව කලක් ගත වන තුරු නියම ක්‍රෙප් රබර් නිපදවීමට අවශ්‍ය යන්ත්‍ර පද්ධතියක් සම්පූර්ණ කොට නොතිබිණැයි කිය හැක.

අද උසස් තත්වයක් භජනය කරන ක්‍රෙප් රබර් නිෂ්පාදනය පිළිබඳව ශ්‍රී ලංකාව කීර්තියක් ලබා ඇත. අපේ සම්පූර්ණ නිෂ්පාදනයෙන් 40% ක්‍රෙප්ය. අපි එයින් වසකට ටොන් 44,000 ක් පමණ නිපදවමු. මේ ප්‍රමාණය හේතුකොට රබර් නිපදවන ලෝකයේ අප විශාලතම නිෂ්පාදකයා වූවා පමණක් නොව උපරිම ශ්‍රේණියේ ක්‍රෙප් අපනයනය කරන්නේද අප විසිනි. අපද්‍රව්‍යයන්ගෙන් බෙහෙවින් නිදොස් වූ ශ්‍රී ලංකා ක්‍රෙප් රබර් පැහැපත් වර්ණයෙන්ද යුක්ත වෙයි.

### සෝල් ක්‍රෙප්

ක්‍රෙප් රබර් නිෂ්පාදනයෙහි වඩා උදර සංවර්ධනයක් වශයෙන් සැළකිය යුතු ශ්‍රී ලංකාව නිපදවන අනික් අර්ධ ශිල්පීය නිමවීමක් නම් 'සෝල් ක්‍රෙප්'නමැති පාවහන් අඩි රබරය යි. සණ ක්‍රෙප් රබර් වලට මුල් අවස්ථාව වන තුනී ක්‍රෙප් රබර් පටි ඉතා සියුම්ව හිල් නැතිව සම්පූර්ණ සම ගණකමින් යුතුව පිළියෙල කර, ලේස් ක්‍රෙප් පටි අවශ්‍ය ගණකම ( 1/4'', 3/16'', 1/8'') ලැබෙන සේ එකට තබා යන්ත්‍රානුසාරයෙන් මැඩීමෙන් මේ රබර් වර්ගය නිමවනු ලබයි. මෙය පිළියෙල කිරීම ඉතා පරිශ්‍රමයෙන් කළයුතුවාක් මෙන් ඊට යන වියදමද අධිකය. එහෙත් අද මෙයට ලැබෙන මිළ සමාන්‍ය ක්‍රෙප් රබර් මිළ මෙන් තුන් ගුණයක් පමණය.

### ස්වාභාවික රබර් හා කෘත්‍රිම රබර්

පළමුවැනි ලෝක මහා යුඩය ( 1914–1918 ) විසින් රබර් කර්මාන්තයෙහි හිස ඔසවා තැබීය. එයට වඩා කීප ගුණයකින් යුතුව දෙවැනි ලෝක මහා සංග්‍රාමය විසින් ස්වාභාවික රබර් කර්මාන්තය වඩා විද්‍යානුකූල වඩා නියත මාර්ගයකට යොමු කරනු ලැබීය.

රබර් ගැන දනුම දීර්ඝ කාලයක් මුළුල්ලේ පැවැති නමුදු එය මහා පරිමාණ කර්මාන්තයක් මෙන් හිස එසෙව්වේ කෙසේද? 1910 අවධියේ ලෝකයේ ම රබර් නිෂ්පාදනය ටොන් ලක්ෂයකට සීමාවිය. යුඩයෙන් පසු, 1920 වන විට රබර් සැපැයීම එමෙන් තුන් ගුණයක් තියුණු විය. මේ නම් යුරෝපීය කර්මාන්තයනට රබර් වල අවශ්‍යතාවය කෙතරම් උග්‍රවීද යන්නෙහි පිළිබිඹු–වෙකි. එම දශකය තුලම අග්නිදිග ආසියාවේ රබර් වගාව අක්කර පන්ලක්ෂයේ සිට හතලිස් ලක්ෂය දක්වා වැඩිවිය. ශිල්පීය රබර් නිෂ්පාදන ක්ෂෙත්‍රයෙහි ලා රබර් අපූර්ව නිමැවුමක් බවට පත්වන්නට වුනේය.

දෙවැනි ලෝක සංග්‍රාමය විසින් මේ හිස එසවීම නව මට්ටමකට නැංවීම කළා පමණක් නොව එක් අතකින් එහි පරිණතියක පොරොන්දුවක් හා අනික් අතින් එයට තර්ජන මාර්ගයක් ද ස්වභාවික රබර් වෙත එල්ල කළේය.

යුරෝපීය ජාතීන් (පසු කලක ජපන් ජනයා) කෘත්‍රිම නිපදවීම අතිශය උත්සුකතාවකින් ඇරැඹුයේ හුදෙක් ස්වාභාවික රබර් සැපයීම ප්‍රමාණවත් නොවූ නිසාම නොවේ. යුඩ සාමයෙන් ඉක්බිතිවම පෙරදිග ලෝකයේ යුරෝපීය යටත් විජිත වාසී ජනයා තමන්ගේ වහල් බැමි බිඳ–ගෙන ස්වාධීනත්වය ප්‍රකට කෙරෙමින් නැගී සිටින්නට වන. මේ ප්‍රගමනය නැවැත්විය නොහැකි බැව් දුටු යුරෝපීයෝ මෙයින් තමන් සතුව තිබූ සෙසු අයිතිවාසිකම් මෙන්ම අග්නිදිග ආසියාවේ තමන්ගේ රබර් කෙතට මින්පසු කුමක් වේදැයි අවිනිශ්චිත වූහ.

අවශ්‍ය ප්‍රාග්ධනය හා විද්‍යාඥනය ලබා ගැනීමේ හැකියාව පිළිබඳ කිසිදු අවහිර නොමැති ධනේශ්වර ජාතීන් වූ ඇමෙරිකානු, ජර්මන්, බ්‍රිතාන්‍ය ආදීන් විශාල වශයෙන් ආරම්භකළ කෘත්‍රිම රබර් නිෂ්පාදනය අතිශයින් සාර්ථක විය. වර්ෂ 1965 දී කෘත්‍රිම රබර් ටොන් තිස්හත් ලක්ෂ අනූපන්දහක් යුරෝපය හා ජපානය නිෂ්පාදනය කළ අතර 1975 දී, එනම් දශකයකට පසුව, එය ටොන් හැටහත් ලක්ෂ හැත්තැපන්දහසක් පමණ විය. මේ අවධිවල ස්වාභාවික රබර් නිපැයුනේ ටොන් විසිතුන් ලක්ෂ පනස් දෙදහක් හා තිස් දෙලක්ෂ අනූහත්දහකි. ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදනය මෙන් දෙගුණයක් කෘත්‍රිම රබර් නිපදවා ඇති බැව් මෙයින් පෙනෙන අතර එය තවත් වැඩි වර්ධනයට පැමිණිය හොත් අපේ ස්වාභාවික රබරයේ ඉරණම කුමක් විය හැකිදැයි යනු මැනක් වන තුරුම ස්වාභාවික රබර් නිපදවන්නන් තුල හේතු සහිත බියක් ඇති කළේය.

ඉතා මෑතදී ඔවුන් තවත් මහත් ජයග්‍රහණයක් ලැබුයේ ස්වභාවික රබර් අණුවට අතිශයින්ම සමාන කෘත්‍රිම අණුවක් නිමවා 'සිස් – පොලිඅයිසොප්‍රීන්' කෘත්‍රිමය බිහි කිරීමෙනි.

### කෘත්‍රිම රබර් පසුබෑම

මේ පරිදි කෘත්‍රිම රබර් විසින් අපේ ස්වභාවික රබර් කාබාසිනියා කිරීමට.ලං වුවද කරුණක් දෙකක් නිසා එය සම්පූර්ණයෙන් ඉටු නොවිය. ( අ ) ස්වාභාවික රබර් මිළ පමණට කෘත්‍රිම රබර් මිළ අඩුකළ නොහැකි විය. ( ආ ) ටයර් ආදී ඇතැම් භාණ්ඩ අවශ්‍ය ගුණාත්මකව නිමවීමට ස්වභාවික රබර් සුළු ප්‍රමාණයක් මිශ්‍ර නොකොට නිෂ්පාදනය කළ නොහැකි විය.

එහෙත් කෘත්‍රිම රබර් නිපදවන්නාට විශාල වාසියක් ඇත. ඔහුගේ රබර් වල හැම ගුණයක්ම නියත වශයෙන් සඳහන් කළ හැකි බැවින් ශිල්පීය රබර් කර්මාන්ත කරුවා හැකි හැමවිටම, එම රබර් පරිහරණය කරයි. සිය කර්මාන්තයට යෙදවීමට පෙර ඒ රබර් පිළිබඳ වෙන ගුණාගුණ විමර්ශනයක් අනවශ්‍ය හෙයින් ඔහුගේ කරදර පමණක් නොව වියදමද අඩුවෙයි.

ස්වාභාවික රබර් එවැනි තාක්ෂණික වර්ගීකරණයකින් සැපයෙන්නේ සුළු කොටසක් පමණය. එහෙත් එය වැඩි වෙමින් පවතී. මේ බෙහෙවින්ම මැලේසියාවේ නිපදවන 'එස්. එම්. ආර්.' රබර් වර්ගය. 'කුට්ටි රබර්' වශයෙන් හඳුන්වන්නේ මෙයයි. ලක්දිව ද කුට්ටි රබර් නිපදවීම අරඹා ඇත. මෙවැනි රබර් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් මාර්ග දර්ශකයක් වශයෙන් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය විසින් සංවිධාන කරන ලදී. මෙය කලක් පිත්කන්ද වතුයායේද පසුව මාවනැල්ලේ ද ප්‍රතිෂ්ඨාපනය කරන ලදී.

අපේ ක්‍රෙප් රබර් එක් අතකින් කුට්ටි රබර් වලට වඩා බෙහෙවින් උසස් ගණයේ යැයි සැළකිය යුතු වුවද 'එම රබර් පිළිබඳව තවමත් තාක්ෂණික වර්ගීකරණයෙන් ගුණ නිර්ණය නොකෙරෙන බැවින් කෘත්‍රිම රබර් හා කුට්ටි රබර් ලබා ඇති විශේෂ වාසියක් අපට තවම හිමි වී නැත.

ඛනිජ තෙල් මිළ නොසිතූ අයුරු වැඩිවීම නිසා අපේ දේශීය ආර්ථිකයට බලවත් පහරක් වැදී ඇත. එහෙත් වාසනාවකට මෙන් තෙල් මිළ නැගීම නිසා තෙල් ද්‍රව්‍ය පදනම් කරගෙන නිපදවන කෘත්‍රිම රබරයට විනාශකාරී පහරක් වැදිණ. 1975 දී එය අඩපණ වීමේ ලකුණු පෙනිණ.

**එස්. එම්. ආර්. වලින් එල්ලවන තරඟය**

අපේ රබර් කර්මාන්තයට එල්ලවී තිබුණු එක් බලගතු තර්ජනයක් මෙසේ ඉවත් වී ගියාක් මෙන් පෙනේ. අනික් තර්ජනය වන මැලේසියානු ප්‍රමාණිකෘත රබර් (SMR) අඩු මිළකට හා තාක්ෂණික ගුණ වර්ග කිරීමෙන් ලෝක වෙළෙඳ පළට සැපයීම ක්‍රමයෙන් දියුණුවන බැවින් ශ්‍රී ලංකා රබර් සම්පාදනය එම තර්ජනයෙන් ගැලැවීමට වගබලා ගැනීම අතිශයින් අවශ්‍යවෙයි.

විශේෂයෙන් අපේ ක්‍රෙප් රබර් වෙළඳාම පිළිබඳ වර්තමානයට හෝ අනාගතයට පිළිල විය හැකි, පෙර කී තත්ත්වය ඇසුරු කොට උද්ගමනය වන, අනර්ථ ගැන ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය සුපරීක්ෂිත අවධානයෙන් යුතුව කටයුතු කරන බැව් සඳහන් කළ යුතුය. එම ආයතනයට අයත් රත්මලානේ පිහිටුවා තිබෙන පිරිවිතර රසායනාගාරයේ එක් අංශයක් මේ කරුණු පිළිබඳ රසායනික පිරික්සුම් පමණක් නොව එයට අදළ බාහිර ක්ෂේත්‍රයටද ගවේෂණයන් පතළ කොට ඇති බැව් සඳහන් කළහැක.

**අනාගත අපේක්ෂාව**

ශ්‍රී ලංකාවේ රබර් ශත සංවත්සරය දෙස ආපසු හැරී බලන මෙම වසරේ යටගියාවෙන් ගතයුතු එකම පාඩම නම් සිරිලකෙහි රබර් වගාව පරිපාලනය හා සම්පාදනය නව්‍ය ක්ෂේත්‍රයක් කරා, නවෝන්නතියක් කරා, පැකිලීමෙන්, ප්‍රමත්තකයෙන් තොරව ගෙන යෑමට නොසැළෙන අධිෂ්ඨානයෙන් ඉදිරියට පා තැබීමයි.

මේ කෘත්‍යය මතු එන සිය වස පුරා පැතිර විය හැකි කතාන්තරයක් නොව, අනාගත දශකය සීමා කොට පරිපූර්ණ සාර්ථකත්වයකින් නිම කළ යුතු උපන්‍යාසයක් විය යුතුය.



2—WT 15833